*සැ.යු.:* 2025.11.14 දින පළ කරන ලද අංක 2463 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,464 - 2025 නොවැම්බර් මස 21 වැනි සිකුරාදා - 2025.11.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

පිටුව

ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :
- ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... —
- අවසාන නියෝග .... ... ... ... —
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... —
- ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම :
- බස්නාහිර පළාත .... ... ... ... —
- මධ්‍යම පළාත .... ... ... ... —
- දකුණු පළාත .... ... ... ... —
- උතුරු පළාත .... ... ... ... —
- නැගෙනහිර පළාත .... ... ... ... —
- වයඹ පළාත .... ... ... ... —
- උතුරු මැද පළාත .... ... ... ... —
- ඌව පළාත .... ... ... ... —
- සබරගමුව පළාත .... ... ... ... —

පිටුව

ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම :
- බස්නාහිර පළාත .... ... ... ... —
- මධ්‍යම පළාත .... ... ... ... —
- දකුණු පළාත .... ... ... ... —
- උතුරු පළාත .... ... ... ... —
- නැගෙනහිර පළාත .... ... ... ... —
- වයඹ පළාත .... ... ... ... —
- උතුරු මැද පළාත .... ... ... ... —
- ඌව පළාත .... ... ... ... —
- සබරගමුව පළාත .... ... ... ... —
- ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... —
- ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... 424
- ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... —
- ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... —
- ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... 425

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තතු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 දෙසැම්බර් මස 12 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 නොවැම්බර් මස 28 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2025 ජුනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

423 - B 082739 - (2025/11)
E - 01

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

උතුරු පළාත් සභාවේ වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඉන්දිරරාසා ප්‍රතාබන් වන මම ඉඩම් සංවර්ධන ආඥා පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1997 අගෝස්තු මස 28 දින ප්‍රදානය කර ඇති අංක වවු/වවු/ප්‍ර/2094 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන උක්කුලාන්කුලම, වවුනියාව පදිංචි සුප්පන් මුත්තුකුමාරු වෙත ප්‍රදානය කොට වවුනියාව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 16/313 යටතේ 18.06.1998 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තික භාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.12.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

වවුනියාව පරිපාලන දිස්ත්‍රික්කයේ වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පත්තුවේ/කෝරලේ පාන්ඩාරිකුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උක්කුලාන්කුලම නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද - අංක F. T. P. - 7 දරන කට්ටි කැබීමේ පිඹුරේ කැබලි අංක 176 දරන ඉඩමෙන් බැහැර කරන ලද ලියාපදිංචි මිනුම්දෝරු එස්. තුරෙයිසිංගම් විසින් සම්පාදිත අංක 1837 දරන පෞද්ගලික සිතියමේ අංක 01 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0506 පර්චස් 20 විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම

*උතුරට* : තිරුවෙන්තූර් මිල්
*නැගෙනහිරට* : කුගන්
*දකුණට* : පාර
*බස්නාහිරට* : තිරුවෙන්තූර් මිල්

අයි. ප්‍රතාබන්,
ප්‍රාදේශීය ලේකම්,
බෝපෙ පෝද්දල.

2025 ජූලි මස 09 වැනි දින.

11-304

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් වින්ධ්‍යා ඩී. සමරක්කොඩි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982.03.08 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/460 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කැටියපේ පදිංචි ගමාච්චිගේ එඩී වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO-1065 යටතේ 1982.04.29 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.12.12 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, කන්දබඩ පත්තුව බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ කන්දබඩ පත්තුවේ කැටියපේ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කැටියපේ නැමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක අ. ග. පි. 132 දරන පිඹුරෙහි අංක 316 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපනය කර ඇති ප්‍රමාණයෙන් අක්කර 01 රූඩ් 01 පර්චස් 12 ක් ඇතැයි ගණන් බලා තිබෙන කැටියපේ මූකලාන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :-

*උතුරට* : අ. ග. පි. 132 හි අංක 315 හා 314 කැබලි
*නැගෙනහිරට* : අ. ග. පි. 132 හි අංක 311 කැබැල්ල
*දකුණට* : අ. ග. පි. 132 හි අංක 311 හා 321 කැබලි
*බස්නාහිරට* : අ. ග. පි. 132 හි අංක 321 කැබැල්ල

වින්ධ්‍යා ඩී. සමරක්කොඩි,
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2024 පෙබරවාරි මස 28 වැනි දින.

11-317/1

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ මාතර කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් සුසන්ත අත්තනායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1982 මාර්තු 10 දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර 2356 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කැකණදුර හා තල්පාවිල උතුර පදිංචි දළඳාවත්තගේ පිංචොහාමි වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO-1043/ යටතේ 1982 අප්‍රේල් මස 29 දින ලියාපදිංචි කරනු ලැබ පසුව මුල් අයිතිකරු ලෙස හන්නාගල ගමගේ ඇලිස් නෝනා නැමැති අයට පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.12.12 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව බටහිර සහ කඩවත් සතර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ වැල්ලබඩ පත්තුවේ නාකුට්ටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කැකණදුර හා තල්පාවිල උතුර නැමැති ගමේ පිහිටා ඇති, අංක මු. පි. මාර 257 දරන පිඹුරේ අංක 722 බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් පර්චස් 38ක් ඇතැයි ගණන් බලා තිබෙන නාකුට්ටියවත්ත යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම්වූ ඉඩම් කට්ටිය :-

| | |
|---|---|
| *උතුරට* | : මු. පි. මාර 257 හි අංක 525 හා 719, 718 කැබලි |
| *නැගෙනහිරට* | : මු. පි. මාර 257 හි අංක 723 කැබැල්ල |
| *දකුණට* | : මු. පි. මාර 257 හි අංක 525 කැබැල්ල |
| *බස්නාහිරට* | : මු. පි. මාර 257 හි අංක 525 කැබැල්ල |

සුසන්ත අත්තනායක,
ප්‍රාදේශීය ලේකම්,
මාතර කඩවත්සතර.

2025 පෙබරවාරි මස 13 වැනි දින.

11-317/2

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය :* 4/10/77258.
*පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LB/L-10/LS/TRI*/MOR/21.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, මොරවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 230 සී නොච්චිකුලම ග්‍රාම නිලධාරි වසමේ මයිලකුඩාවැව ගමේ බලයලත් මිනින්දෝරු විසින් අඳින ලද අංක 0398 අනුරේඛනයේ කැබලි අංක ඒ හි දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 02 ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික කටයුතු සඳහා ජිනදාසගේ අනුපමා මිය නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ.

| | |
|---|---|
| *උතුරට* | : පාර (RDA ) |
| *නැගෙනහිරට* | : රජයේ ඉඩම |
| *දකුණට* | : ඩබ්. ආර්. දීපිකාගේ ඉඩම |
| *බටහිරට* | : මාර්ගය |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය.* - අවුරුදු තිහයි. (30) (2025.09.26 දින සිට 2055.09.25 දක්වා)

*වාර්ෂික බදු මුදල* .- 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2025 වර්ෂයේ ඉඩමේ තක්සේරු

වටිනාකම රුපියල් මිලියන පහ හෝ පහකට (රු. 5,000,000) වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක්ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

*වාර මුදල* :- වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය.

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලටද මෙම බද්ද යටත් විය යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාලසීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2025.09.26 දින සිට වසර පහක අවම කාලයක් ඉක්මවීමට කලින් පැවරීම් හෝ අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට් පත්‍රයේ* පළ කල දින සිට සති 06 ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

තුසිත ගලප්පත්ති,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2025 නොවැම්බර් මස 01 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11-229

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.